# බිලියන 8: නිමක් නැති ශක්‍යතාවන් සපිරි ලොවක්

## විඩියෝ තරගය!

එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කටයුතු අංශයට අනුව, 2022 නොවැම්බර් 15 දින වනවිට ගෝලීය ජනගහනය බිලියන 8ක් වනු ඇත. එය මනුෂ්‍ය ප්‍රජාවෙහි වැදගත් සන්ධිස්ථානයකි. සෞඛ්‍ය සේවාවෙහි වැඩිදියුණු කිරීම් සහ ගෝලීය දරිද්‍රතාව අවම කිරීම් මගින් මාතෘ සහ ළදරු මරණ ප්‍රතිශතය අඩු වීමත් ආයු කාලයේ වැඩිවීමත් සිදු ව ඇති බැවින්, අන් කවරදාකටත් වඩා වැඩි ජනගහනයක් මිහිමත ජීවත්වන අවස්ථාව මෙසේ උදා වී තිබේ!

බිලියන 8ක ලෝකයක් යනු, නිමක් නැති ශක්‍යතාවන් නියෝජනය වීමකි.

අපේ සමාජය මුහුණ පා ඇති අභියෝගයන්ට ඔබේ විසඳුම් නිර්මාණාත්මකව බෙදා-හදා ගැනීමේ අවස්ථාව ඔබ වෙත උදා කරමින් UNFPA ශ්‍රී ලංකා විසින් විඩියෝ තරගයක් පවත්වනු ලබයි. ඒ අනුව, අප සියලුදෙනා උදෙසා සාධාරණ වූත්, තිරසාර වූත් ලෝකයක් ගොඩනැංවීමෙහි ලා දායකත්වය සැපයීමේ හැකියාව ඔබේ අදහස් වලට ලැබී ඇත.

## තරගය පිළිබඳව

ශ්‍රී ලංකාවේ පදිංචි ඕනෑම කෙනෙකුට විවෘතයි.

ඇතුළත්වීම සඳහා:

1. තරගයේ මාතෘකා වලින් එකක් තෝරාගන්න.
2. තෝරාගත් මාතෘකාව ගැන ගවේෂණය කර, ඒ යටතේ ඇති විශේෂිත ගැටලුවක් හඳුනාගෙන, ඔබේ තිරසාර විසඳුම සංවර්ධනය කරන්න / ගොඩනගන්න.
3. ගැටලුව සහ ඔබේ විසඳුම විස්තර කෙරෙන විනාඩි 1-2ක විඩියෝවක් තනන්න.
4. ඔබේ විඩියෝව යූටියුබ් වෙත උඩුගත කරන්න.
5. ඔන්ලයින් ඇතුළත්වීමේ පෝරමය භාවිතයෙන් ඔබේ යූටියුබ් සබැඳිය ඉදිරිපත් කරන්න.
6. ඔබේ විඩියෝව බෙදා-හදාගෙන, වැඩි likes ප්‍රමාණයක් ලබාගන්න.

ඇතුළත්වීම් පිළිගැනීම කාණ්ඩ 3ක් යටතේ සිදු කෙරෙයි:

1. ළමුන් - තනි තනිව හෝ කණ්ඩායමක් වශයෙන් විඩියෝවක් ඉදිරිපත් කිරීම වයස අවුරුදු 18න් පහළ තනි පුද්ගලයින් ලෙසට.
2. විවෘත - තනි තනිව හෝ කණ්ඩායමක් වශයෙන් විඩියෝවක් ඉදිරිපත් කිරීම වයස අවුරුදු 18න් ඉහළ තනි පුද්ගලයින් ලෙසට.

   කණ්ඩායම් වශයෙන් ඇතුළත්වීමට අවම වශයෙන් 2 සිට උපරිම වශයෙන් 3 දක්වා වූ සාමාජිකයන් ලෙසට.

## ඉදිරිපත් කිරීම් අවසන් වන දිනය

- 2023 ජනවාරි 15 දින ප.ව. 5.00!

## ඔබේ ඇතුළත්වීම ඉදිරිපත් කළ යුතු අයුරු

- ඔබේ යූටියුබ් නාලිකාවට වීඩියෝව උඩුගත කරන්න.
- ඔබේ තොරතුරු සහ ඔබේ යූටියුබ් නාලිකාවේ සබැඳිය සමග නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඔන්ලයින් ඇතුළත්වීමේ පෝරමය ඉදිරිපත් කරන්න.

තරගය සඳහා මාතෘකා

1. වයස්ගත වන ජනගහනය

සරුබව හීනවීම සහ ආයු කාලය වැඩිවීම හේතුවෙන් ගෝලීය ජනගහනය සීග්‍රයෙන් වයස්ගත වෙමින් පවතියි. සංවර්ධනය වෙමින් පවතින රටවල, ආසන්න වශයෙන් සෑම මිනිසුන් පස්දෙනෙකුගෙන් එක් අයෙකු වසර 2050 වනවිට වයස අවුරුදු 60ට වැඩි වනු ඇත.

සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් බොහෝ රටවලට වඩා සීග්‍රයෙන් ශ්‍රී ලංකාව ක්‍රමයෙන් වයස්ගත සමාජයක් බවට පරිවර්තනය වෙමින් පවතියි. 1981 සහ 2012 අතර කාලය තුළ දී වයස අවුරුදු 60 සහ ඊට ඉහළ ජනගහනයේ සමානුපාතය 6.6% සිට 12.4% දක්වා වැඩි වී ඇති අතර, 2037 වනවිට එය 22.1% දක්වා වැඩි වනු ඇතැයි අනුමාන කෙරෙයි. වයස් සංයුතියෙහි සිදු වන මෙකී වෙනස සමාජයේ දේශපාලනමය, ආර්ථිකමය සහ සමාජීය ව්‍යුහයට ද බලපානු ඇති අතර, සම්පත් බෙදාහැරීමේ රටාවෙහි වෙනස්කම් ඇති කිරීමේ අවශ්‍යතාවක් ද එමගින් පැන නගියි.

ජනගහනය වයස්ගත වනවිට, පවතින ශ්‍රම බලකායෙහි වෙනස්කම් සිදුවීමෙන්, ඵලදායීතාවට ද අනිටු විපාක ඇති වේ. ජනතාව දිගු කාලයක් ජීවත් වුවත්, මෙකී වෙනසට අනුව රැකියා ආකෘති වල හැඩ ගැසීමක් සිදු ව නොමැත. වයස්ගත පුද්ගලයන්ගේ ආදායම් අහිමිවීම නිසා දිළිඳු බව ඇති විය හැකි බැවින් ඔවුන්ට සිය පවුල් මත යැපීමට සිදු විය හැකි සේ ම, විශ්‍රාමික වැටුප්, සමාජ සහය හෝ ඉතුරුම් වැඩපිළිවෙල ආදිය හරහා රජය මත යැපීමට ද සිදු විය හැකිය. 2019 වනවිට 17.9%ක අනුපාතිකයක් පෙන්නුම් කෙරෙන වැඩිම පුද්ගල සංඛ්‍යාව අනුව, රටෙහි දිළිඳුතම වයස් කාණ්ඩය බවට පත් ව සිටින්නේ වයස්ගත පුද්ගලයන් ය.

වයස්ගත පුද්ගලයන්ට සිය එදිනෙදා ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන අපහසුතා බොහෝ ය. බෝ-නොවන රෝග තත්ත්වයන්ගේ ඉහළ යාමක් ද වයස්ගත පුද්ගලයන් අතර දක්නට ඇති බැවින්, වයස්ගත වූ බොහෝ අයට, අසනීප හේතුවෙන් ඇති වූ කිසියම් ආකාරයේ ආබාධිත තත්ත්වයන් සමග ජීවත් වීමට සිදුවී ඇත. වයස-ආශ්‍රිත සෞඛ්‍යමය හේතු මත ඔවුන්ගේ ශාරීරික හැකියාවන් සීමා වීම ද දක්නට තිබේ. ප්‍රවාහන පහසුකම් වෙත ප්‍රවේශ වීමේ අසීරුතා සහ නුසුදුසු තත්ත්වයන් යටතේ පවතින නිවාස වල ජීවත් වීමට සිදුවීම ආදිය ඔවුන්ගේ හුදෙකලා බව සහ තනිකම වැඩිකොට ඇති අතර, එම නිසා ඔවුන්ගේ මූලික දෛනික කටයුතු වලට ඇති ව තිබෙන බලපෑම අතිමහත් ය. එය ඔවුන්ගේ නිදහස, ස්වාධීනත්වය සහ ජීවිතයේ ගුණාත්මක භාවය ද හීන කරයි. වයස්ගතබව මත පදනම් වූ වෙනස්කොට සැලකීම (ageism)

යනු පුළුල් ව දක්නට ලැබෙන සංසිද්ධියකි. වයස්ගත පුද්ගලයන් විසින් සමාජය වෙතට ලබාදිය හැකි දායකත්වයට සහ සහභාගිත්වයට එය බලපාන හෙයින්, ඔවුන් ආන්තීකරණයට සහ බැහැර කිරීමට ලක් විය හැකිය.

වයස්ගත වන ජනගහනයේ ශක්‍යතාවන්ට නිසි තැන ලබාදීමේ හැකියාවැති විසඳුම් සෙවීම අප විසින් කළ යුතු ව පවතියි. රැකියා, සෞඛ්‍යය, සමාජ ආරක්ෂණය, නගර, නිවාස, ප්‍රවාහනය ආදිය ගැන අප විසින් නිර්මාණාත්මක අයුරින් නැවත සිතා බැලීමේ කාලය දැන් එළඹ ඇත. ඒ හරහා වයස්ගත පුද්ගලයන්ගේ ජීවිත වල ගුණාත්මක භාවය වැඩිදියුණු කරමින්, ඔවුන්ගේ අයිතීන් සුරැකීමත්, අපේ සමාජය වෙත ඔවුන්ගේ වටිනා දායකත්වය සහතික කිරීමත් අපට සිදු කළ හැකියි.

## 2. ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාව

ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාව - කාන්තාවන් හා පිරිමි සහ ගැහැනු ළමුන් හා පිරිමි ළමුන් පිළිබඳ සමාන අයිතීන්, වගකීම් සහ යෝග්‍යාවස්ථාවන් - යනු මූලික මානව අයිතිවාසිකමකි. ලෝකයේ ජනගහනයෙන් අඩක් ම පමණ කාන්තාවන්ගෙන් සමන්විත වේ. පසුගිය දශක කිහිපය තුළ යම් ප්‍රගතියක් පෙන්නුම් කළ ද, දිගින් දිගට ම ඔවුන් සිය ජීවිත කාලය පුරාවට ම නොයෙක් ආකාරයේ වෙනස්කොට සැලකීම් වලට මුහුණ පානු ලබයි. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52%ක් කාන්තාවන් වන අතර, ඔවුන්ගේ ආයු කාලය පිරිමින්ගේ ආයු කාලයට වඩා වැඩිය. නමුත්, සමාජීය, ආර්ථික සහ නෛතික බාධාවන්ට මුහුණ පෑමට සිදු වීම නිසා සිය අයිතීන් අනුව කටයුතු කිරීම් හා තම ශක්‍යතාවන් පූර්ණ ලෙස යොදා ගැනීම් ආදිය සීමා වී ඇත. තවද, ශ්‍රී ලංකාවේ බොහෝ ගැහැනු ළමුන් හා කාන්තාවන් සිය අධ්‍යාපනය සම්පූර්ණ කරන නමුත්, ශ්‍රම බලකාය වෙත ඔවුන් දක්වන සහභාගිත්වයත් නායකත්ව වෙත කෙරෙන නියෝජනයත් පවතින්නේ අඩු මට්ටමක ය. 2021 වර්ෂයේ දී, ශ්‍රම බලකා සහභාගිත්ව ප්‍රතිශතය 31.8%ක් විය. පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය පෙන්නුම් කළේ 5.3%ක් වශයෙනි. කිසිදු ගෙවීමක් නොලැබ, රැකබලා ගැනීමේ කාර්යයන් හි දිගින් දිගට ම නිරත වීමට කාන්තාවන්ට සහ ගැහැනු ළමුන් සිදු ව ඇත. ආර්ථිකය හා ගත් කල කාන්තාවන් බලගැන්වීම සහ දායක කරගැනීම සම්බන්ධයෙන් වන බාධාවන් ලෙසට සැලකිය හැකි කරුණු අතර, පවත්නා ස්ත්‍රී-පුරුෂ සමාජභාව සහ සමාජ සම්මතයන්, දැරිය හැකි මිලට සහ ගුණාත්මක භාවයෙන් යුතු දරුවන් රැක-බලා ගැනීමේ සේවාවන් නොමැති කම, නිවසේ වැඩ-කටයුතු බෙදා-හදා ගෙන සිදු කිරීමේ සහය නොලැබීම, සේවාස්ථාන සංස්කෘතීන්, ආරක්ෂාව සහ ආරක්ෂණය නොමැති කම ආදිය වේ.

ශ්‍රම බලකාය වෙත කාන්තා සහභාගිත්වය සීමා කිරීම නිසා විශ්‍රාම වැටුප් සහ ඉතිරි කිරීම් වෙත ඔවුන්ට ප්‍රවේශයක් නොලැබේ. වයස්ගත වනවිට ඔවුන්ගේ දිළිඳු බව වැඩි වීමටත් අනුන් මත යැපීමට සිදු වීමටත් එය හේතු වේ. ශ්‍රී ලංකාව වයස්ගත සමාජයක් බවට වේගයෙන් පරිවර්තනය වෙමින් පවතින මෙම

වකවානුවේ එය විශේෂ සැලකිල්ල යොමු විය යුතු කරුණක් වන්නේ, එහි ජනගහනයෙන් බහුතරය කාන්තාවන්ගෙන් සමන්විත වන නිසාවෙනි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාව හා සමාජ සම්මතයන් යනු කාන්තාවන් බලගැන්වීමෙහි ලා දිගින් දිගටම පවතින බාධාවන් ය. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් සෑම 5 දෙනෙකු අතරින් 1 අයෙකු (20.4%) විසින් සිය ජීවිත කාලය තුළ දී සමීප සහකරුවකුගේ ලිංගික සහ/හෝ කායික ප්‍රචණ්ඩත්වයට මුහුණ දී ඇත; කාන්තාවන්ගෙන් සෑම 4 දෙනෙකු අතරින් 1 අයෙකු (24.9%) විසින් වයස අවුරුදු 15 කාලයේ පටන් ලිංගික සහ/හෝ කායික ප්‍රචණ්ඩත්වයට මුහුණ දී ඇත (කාන්තා යහපැවැත්ම පිළිබඳ සමීක්ෂණය, 2019). ශ්‍රී ලාංකේය කාන්තාවන් සහ ගැහැනු ළමුන්ගෙන් 90%ක් පමණ සිය ජීවිත කාලය තුළ, පොදු බස්රථ හෝ දුම්රිය වල දී ලිංගික හිංසනයට මුහුණ පා ඇති බව ද සාක්ෂි අනුව පෙනී යයි. මෙකී ප්‍රචණ්ඩත්වයන් කාන්තාවන් සහ ගැහැනු ළමුන්ගේ සෞඛ්‍යය, ගරුත්වය, සුරක්ෂිත භාවය සහ ස්වාධීනත්වය දුර්වල තත්ත්වයකට පත් කරන නමුත්, ගොළුවත රැකීමේ සංස්කෘතියක් තුළ එය යටපත් වේ.

ලිංගික හා ප්‍රජනක අයිතීන් ගැන දැන සිටීම ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාව සාක්ෂාත් කරගැනීමෙහි ලා වැදගත් වේ. කාන්තාවකට සිය පවුල සැලසුම් කළ හැකි වූ විට, ඇයට ඇයගේ මුළු ජීවිතය ම සැලසුම් කිරීමේ හැකියාව ලැබේ. සිය දරුවන් ගණන, දරුවන් ලබන කාලවකවානු සහ දරුවන් අතර වයස් පරතර ආදිය ද ඇතුළුව - ඇයගේ ප්‍රජනක අයිතීන් ආරක්ෂා කිරීම හා දිරිගැන්වීම - සමාජය වෙත පූර්ණ සහභාගීත්වය හා සමානාත්මතාව සම්බන්ධයෙන් ඇයට ඇති නිදහස සහතික කිරීමෙහි ලා අත්‍යවශ්‍ය කරුණු වේ. ලිංගික ප්‍රජනක සෞඛ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය පවතින විට, නියමිත කාලයට පෙර සහ බොහෝ වාර ගණනින් සිදුවන ගැබ් ගැනීම් ආශ්‍රිත සෞඛ්‍ය අවදානම් අවම කරගැනීමට සහය ලැබේ. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් අතර ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ආශ්‍රිත දැනුම සතුටුදායක නොවූ අතර, ඔවුන්ගෙන් 50%ක් පමණ, ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ගැටලු වල බොහෝ මූලික පැතිකඩ පිළිබඳ දැනුවත් නොවූ අය විය. ගැහැනු ළමුන්ගෙන් 66%ක් පමණ ඔසප්වීම ආරම්භ වනතෙක්ම ඒ ගැන දැන නොසිටි අය විය. අවුරුදු 15-24 දක්වා වයස් කාණ්ඩයන් අතර එච්අයිවී ආසාදනය ඉහළ ගොස් ඇත. ගැබ් ගැනීම් වැළැක්වීමට භාවිත කරන දෑ යොදා ගැනීම ද රට තුළ අඩු වී ඇති බව දත්ත මගින් පෙන්නුම් කෙරෙයි. 2016 වර්ෂයේ දී කාන්තාවන් අතරින් 35%ක් ගැබ් ගැනීම් වළක්වන දෑ යොදා ගෙන නොමැති අතර, ගැබ් ගැනීම් වළක්වන දෑ යොදා ගැනීමට පටන්ගත් කාන්තාවන් ද ඒවා යොදා ගැනීම නතර කර ඇති බවත් පෙන්නුම් කෙරෙයි (ජනවිකාස සහ සෞඛ්‍ය සමීක්ෂණ වාර්තාව, 2016). ගැබ් ගැනීම් වළක්වන දෑ යොදා ගැනීම තරුණ වයස් කාණ්ඩයන් (අවුරුදු 15 – 34) අතර පහත වැටී ඇත. නෛතික සීමා කිරීම් කෙසේ වුවද, ශ්‍රී ලංකාව තුළ දිනපතා අනාරක්ෂිත ගබ්සා කිරීම් 650ක ට වැඩි සංඛ්‍යාවක් සිදු කෙරෙන අතර, ඒවායින් 80%ක ට වැඩි

සංඛ්‍යාවකට ප්‍රවේශය ලබාගන්නේ වයස අවුරුදු 30ට වැඩි විවාහක කාන්තාවන් විසින් ය. අනාරක්ෂිත ගබ්සා කිරීම් මගින් පෙන්නුම් කෙරෙන තවත් කාරණාවක් වන්නේ කාන්තාවන් හට සිය ලිංගික හා ප්‍රජනක අයිතීන් පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවීමේ නොහැකියාවක් ඇති බව ය.

බලගැන්වූ කාන්තාවන් හට සිය පවුල් වල හා ප්‍රජාවෙහි සෞඛ්‍යය සහ ඵලදායීතාව වෙත දායකත්වය ලබා දීමට හැකිවීම, ආර්ථික වර්ධනයට ද හේතු වනු ඇත. අපේ සමාජය සෞභාග්‍යවත් වීම පිණිස, මූලික සේවාවන්, රැකියා අවස්ථාවන්, සමාජ ආරක්ෂණයන් වෙත කාන්තාවන් සහ ගැහැනු ළමුන්ට ප්‍රවේශය තිබෙන බැව් අප විසින් සහතික කළ යුතු වන අතරම, වෙනස්කොට සැලකීමකින් හා ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිත ගත කිරීමේ අවස්ථාව ඔවුන්ට තිබෙන විට, දැනුවත් භාවයෙන් යුතු තීරණ ගැනීමේ හැකියාව සහ අභිමානවත් අන්දමින් ජීවත් වීමේ අවස්ථාව ද ඔවුන්ට හිමි වනු ඇත.

## තරගයේ නීතිරීති

- මාතෘකා සහ ප්‍රණාමයන් ද ඇතුළුව වීඩියෝවෙහි කාලය විය යුත්තේ, විනාඩි 1-2 දක්වා ය.
- සහභාගි වන්නන් විසින් තරග මාතෘකා දෙක අතරින් එකක් තෝරාගෙන ගවේෂණය කර, විශේෂිත ගැටලුවක් තෝරාගෙන, තිරසාර විසඳුමක් සංවර්ධනය කර/ගොඩනගා, වීඩියෝවක් නිර්මාණය කළ යුතු ය.
- අපහාසාත්මක, අපවාදාත්මක, ලිංගික වශයෙන් අසභ්‍ය, නිගරු වූ හෝ වෙනත් නුසුදුසු අන්තර්ගතයන් හෝ සිය ඉදිරිපත් කිරීමෙහි අඩංගු නොවිය යුතු අතර, කිසියම් හෝ තෙවැනි පාර්ශ්වයක අයිතීන්, කර්තෘ හිමිකම්, වෙළඳ ලකුණු, හෝ ප්‍රකාශන අයිතීන්, පෞද්ගලිකත්ව හෝ කීර්තිනාම අපකීර්තියට පත් කිරීමක් හෝ අන්‍යාකාරයකින් උල්ලංඝනය කිරීමක් හෝ නොවිය යුතු වේ. කිසියම් නිෂ්පාදනයක් හෝ සේවාවක් ප්‍රවර්ධනය කෙරෙන කිසියම් හෝ දෙයක් සිය ඉදිරිපත් කිරීමෙහි අඩංගු නොවිය යුතු ය.
- වීඩියෝ නිෂ්පාදනය පිළිබඳ ඕනෑම තාක්ෂණයක් හෝ රීතියක් යොදා ගැනීම කළ හැකියි (උදා: සජීවකරණ, වාර්තා චිත්‍රපට, නාට්‍ය, ගවේෂණාත්මක හෝ කලාත්මක වීඩියෝ, සහ දෙමුහුන් කාර්ය).
- ඇතුළත්වීම් යූටියුබ් වෙත උඩුගත කළ යුතු වේ.
- ඕනෑම දේශීය භාෂාවකින් ඇතුළත්වීම් ඉදිරිපත් කළ හැකිය. ඉංග්‍රීසි උපසිරැසි යෙදීමට අනුබල දේ.
- කර්තෘ හිමිකම් සහිත දෑ (සංගීතය, රූප, වීඩියෝ, ආදිය) හි හිමිකම් අයිතිය ඔබ සතු වන්නේ නම් හෝ මෙම තරගය සඳහා ඒවා යොදා ගැනීමට බලපත්‍රයක් ඔබ සතු වන්නේ නම් හෝ මිස, මෙම තරගයට එවැනි ද්‍රව්‍ය යොදා නොගත යුතු වේ.

- කර්තෘ හිමිකම් සහිත සියලු දෑ සම්බන්ධයෙන් ඉල්ලා සිටියහොත්, ලබා ගන්නා ලද ලිඛිත අවසරය ඉදිරිපත් කළ යුතු වේ.
- 2023 ජනවාරි 15 දින ප.ව. 5.00 ට පෙර ඇතුළත්වීම් ඉදිරිපත් කිරීම සිදු කළ යුත්තේ ඔන්ලයින් ඇතුළත්වීමේ පෝරමය භාවිතයෙනි.
- ඔන්ලයින් ඇතුළත්වීමේ පෝරමය ඉදිරිපත් කළ යුත්තේ යූටියුබ් හි විඩියෝව වෙත සබැඳියක් සහ ඔබේ මූලාශ්‍ර ලැයිස්තුව (මූලාශ්‍ර වෙත සබැඳි, ප්‍රමාණවත් වේ) ද සහිතව ය.
- ඉදිරිපත් කිරීම් මුල් කෘති වශයෙන් සහ ඔබේම කාර්යයක් ලෙසින් සිදු කළ ඒවා විය යුතු ය. ඔබ ඉදිරිපත් කරන විඩියෝව ඔබේ ම මුල් කෘතියක් නොවන බවට සොයා ගැනුණහොත්, ඔබේ ඇතුළත්වීම සුදුසුකම් නොලබනු ඇත.
- ඉදිරිපත් කිරීම් යූටියුබ් වෙත උඩුගත කරන විට, විඩියෝ තරගය සම්බන්ධයෙන් UNFPA හට බා ගැනීමට, සබැඳි කිරීමට හෝ UNFPA වෙබ්අඩවියට හෝ වෙනත් මාධ්‍ය වෙත ඇතුළත් කිරීමට හැකියාව සැලසෙන පරිදි පෞද්ගලිකත්ව/බෙදා-හදා ගැනීමේ සැකසුම් තෝරා ගැනීම ආදිය ඇතුළත් වන තැනැත්තන් විසින් කළ යුතු වේ.

  මෙම තරඟයට වීඩියෝවක් ඉදිරිපත් කිරීමෙන්, එම විදෙයෝව UNFPA අයතනය විසින් ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ භාවිතා කිරීම සහතික නොවේ
- ඇතුළත්වීම් ඉදිරිපත් කළ යුත්තේ තනි පුද්ගලයින් වශයෙන් හෝ තනි පුද්ගලයින් තිදෙනෙකු දක්වා වන කණ්ඩායම් වශයෙන් ය.
- තරගයේ කාණ්ඩය හෝ මාතෘකාව කුමක් වුවද, තරගයට සහභාගි වන එක් තනි පුද්ගලයකු විසින් ඉදිරිපත් කළ හැක්කේ එක් විඩියෝවක් පමණි.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සහභාගි වන පුද්ගලයන්ගේ වයස් සීමාවන් එක් කාණ්ඩයකට වැඩි වයස් සීමාවන්ගෙන් යුක්ත නම්, කණ්ඩායමේ සිටින වයසින් වැඩිම සාමාජිකයන්ගේ වයස පිළිබිඹු කෙරෙන කාණ්ඩය තෝරා ගැනීම කණ්ඩායම විසින් කළ යුතු වේ.
- විඩියෝවෙහි හොඳින් හඳුනාගත හැකි කිසියම් හෝ පුද්ගලයකු දැක්වෙයි නම්, නිල ඡායාරූප/විඩියෝ නිකුත් කිරීමේ පෝරමයකට අත්සන් තැබීම, ඇතුළත්වීම ඉදිරිපත් කිරීමට පෙරාතුව සිදු කළ යුතු වේ - බාලවයස්කාරයන් සම්බන්ධයෙන් වනවිට, දෙමාපිය හෝ භාරකරුගේ අත්සන ලබාගත යුතු වේ.

## විනිශ්චය කිරීම

විනිශ්චය මණ්ඩලය විසින් ඔවුන්ගේ තෝරා ගැනීම් සිදු කිරීමේ දී, පහත නිර්ණායකයන් සැලකිල්ලට ගනු ඇත:

- අන්තර්ගතයෙහි සහ අදහසෙහි ඇති නව-නිර්මාණාත්මක බව.

- අදහස ඉදිරිපත්කිරීමේ සමස්ත ස්වාභාවය.
- විඩියෝවෙහි දෘශ්‍ය නිර්මාණය සහ පෙනුම හා දැනෙන-හැඟෙන බව (සජීවකරණය හෝ සජීවී ක්‍රියා).
- ප්‍රේක්ෂකයන්ට පණිවුඩය අවබෝධ වන අයුරු සහ එයින් ඇති කෙරෙන යහපත් බලපෑම.
- යූටියුබ් විඩියෝවට ලැබුණු likes ගණන. 2023 ජනවාරි 19 දින වනවිට ලැබී ඇති වැඩිම likes ප්‍රමාණය මත පදනම් ව, ජයග්‍රාහකයා තේරීම සිදු කෙරෙනු ඇත.

තරගයේ නිල නීතිරීති මගින් බැඳී සිටීමට ඇතුළත් වන්නන් එකඟ වේ. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසානාත්මක සහ අවිවාදිත වේ.

ත්‍යාග

මාතෘකාව මත පදනම් ව, එක් එක් කාණ්ඩයෙන් ජයග්‍රාහකයින් දෙදෙනෙකු සඳහා ත්‍යාග ප්‍රදානය (සමස්ත ත්‍යාග ගණන 06 යි) සිදු කෙරෙනු ඇත.

- ළමුන්: ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාව, වයස්ගත වීම, වැඩිම likes ගණන (ත්‍යාග 3යි)
- විවෘත: ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාව, වයස්ගත වීම, වැඩිම likes ගණන (ත්‍යාග 3යි)

ත්‍යාග වලට මුදල් වවුචර (රුපියල් 100,000 දක්වා) සහ පරිගණක ටැබ්ලට්ස් අඩංගු වේ.

2023 ජනවාරි 30 දින වනවිට විද්‍යුත් තැපැල හරහා ජයග්‍රාහකයන් වෙත දැනුම් දෙනු ලැබේ.

## ඔබේ විඩියෝව සඳහා ඉඟි

- ඔබ වඩාත් උනන්දුව සහ ආශාවක් දක්වන මාතෘකාවක් තරග මාතෘකා දෙක අතරින් තෝරා ගන්න.
- මාතෘකාව ගැන ගවේෂණය කර, ඒ පිළිබඳ එක් විශේෂිත ගැටලුවක් තෝරා ගන්න. වයස්ගත වන ජනගහනය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාව යනු පුළුල් මාතෘකා වන අතර, ඒවා යටතේ ඇති ගැටලු ද බොහෝ ය. ගවේෂණය කර, ඔබ අවධානය යොමු කිරීමට කැමති එක් විශේෂිත ගැටලුවක් හඳුනාගැනීම වඩාත් හොඳ ය.
- විසඳුමක් සංවර්ධනය කරන්න/ගොඩනගන්න. ඔබ හඳුනාගත් ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ඔබේ විසඳුම් වලට ඇති බවට සහතික වන්න.
- ඔබේ විඩියෝව සැලසුම් කරන්න. ඔබට කතන්දර පුවරුවක් (ස්ටෝරිබෝඩ් එකක්) යොදා ගත හැකියි.
- පැහැදිලි, ලුහුඬු විඩියෝවක් නිර්මාණය කරන්න. ඔබේ විසඳුමට සහය දැක්වීම සම්බන්ධයෙන් ඔබ සොයාගත් සියලු තොරතුරු නොව, ඔබ සතු හොඳම තොරතුරු යොදා ගන්න.
- ඔබේ විඩියෝව රූගත කරන විට ලෑන්ඩ්ස්කේප් මාදිලිය යොදා ගැනීමට මතක තබාගන්න. සෙවනැලි නොවැටෙන බවට සහතික වීමට ඔබේ ආලෝකකරණය පරීක්ෂා කරන්න. ශබ්ද පැහැදිලි බව සහතික කර ගැනීමට ශබ්ද පරීක්ෂා කිරීම ද සිදු කරන්න.
- වැඩි Likes ගණනක් ලබාගැනීම සඳහා යූටියුබ් වෙත ඔබේ විඩියෝව කල් තබා උඩුගත කිරීම වාසිදායක විය හැකියි.

## සම්බන්ධ වීම

තරගය පිළිබඳ ප්‍රශ්න විමසීමට, කරුණාකර srilanka@unfpa.org වෙත විද්‍යුත් තැපැල් ලිපියක් යොමු කරන්න

කරුණාකර ඔබේ ප්‍රශ්න එවන විට, මාතෘකාව ලෙසට: *බිලියන 8 - ඔන්ලයින් විඩියෝ තරගය* යනුවෙන් සඳහන් කිරීමට මතක තබාගන්න.